අධ්‍යාපන චක්‍රලේඛ - 24/2025

මගේ අංකය - ED/05/67/37/06 (වා.ස්.මා 2026)
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන
අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.
2025.06. 27

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
ජාතික පාසල් විදුහල්පතිවරුන්,
අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්,
ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්,
ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවන්,

**අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පත් කරන ලද අනධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2026**

අංක 2310/29 හා 2022.12.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII පරිච්ඡේදයෙහි සඳහන් රාජ්‍ය නිලධරයන්ගේ ස්ථාන මාරු කිරීම් සම්බන්ධයෙන් වන විධිවිධානවලට ද මේ සමඟ ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක PSC/EST/02-04-34/01/2017 සහ 2017.06.21 දිනැති ලිපියෙන් අනුමැතිය ලද අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පත් කරන ලද අනධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් නිලධරයන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියට ද මෙයින් ඔබේ අවධානය යොමු කරවනු ලැබේ.

**02.** අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පත් කරන ලද අනධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් පහත සඳහන් නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2026 ජනවාරි මස 01 දින සිට බල පැවැත්වෙන සේ ක්‍රියාත්මක විය යුතුය.

I. ව්‍යාපෘති නිලධාරි (නොවිධිමත් අධ්‍යාපන)
II. සංවර්ධන සහකාර / මූල්‍ය සහකාර
III. කළමනාකරණ සහකාර (උපාධි)
IV. ලේඛන සහකාර
V. ශිෂ්‍ය නිවාසාධිකාරී
VI. සහකාර ශිෂ්‍ය නිවාසාධිකාරී
VII. රසායනාගාර සහකාර
VIII. කාර්ය සහායක
IX. සේවා සහායක - සනීපාරක්ෂක
X. අරක්කැමි
XI. ජල නල/විදුලි/වඩු කාර්මික
XII. රසායනාගාර සහායක
XIII. පුස්තකාල සහායක
XIV. තාක්ෂණපීඨ සහායක
XV. පාසල් ආරක්ෂක
XVI. ක්‍රීඩා පුහුණුකරු

**03.** නිලධරයන්ට මෙන්ම ආයතනවල සේවාවන්ට ද ඇති වන අපහසුතා මඟහැරවීම පිණිස පහත සඳහන් ආකාරයට ස්ථාන මාරු පිළිබඳ ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට සැලකිලිමත් විය යුතුය. තවද 2025 ජූලි මස 01 දිනයත්, 2026 ජනවාරි මස 01 වන දිනයත් අතර කාලයේ දී අන්‍යෝන්‍ය ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලුම්පත්‍ර භාර ගනු නොලැබේ.

**04. ස්ථාන මාරු සඳහා නිලධරයන්ගේ සුදුසුකම් තීරණය කිරීමේ පොදු ප්‍රතිපත්තිය**

මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පත් කරන ලද අනධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් නිලධරයන්ගේ ඉහත කී වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ දෙවන වගන්තියේ සඳහන් පහත විධිවිධාන අදාළ වේ.

I. තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර දෙකක් (02) සේවය කරන ලද නිලධරයන් වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

II. එකම සේවා ස්ථානයක වසර පහකට(05) වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් ස්ථාන මාරුවීම් වලට යටත් වේ.

III. ප්‍රියමනාප සේවා ස්ථානවල වසර පහක (05) සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධරයන් අනිවාර්යයෙන්ම ස්ථාන මාරුවීම් වලට යටත් වේ.

IV. එකම කලාපයක ජනප්‍රිය සේවා ස්ථානවල වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධරයන් දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරු කිරීමට යටත් වේ.

**05. ස්ථාන මාරු කමිටු වෙත ඉදිරිපත් කළයුතු ලේඛන**

I. ඒ අනුව තැපැල් මඟින් ඉදිරිපත් කිරීමේදී ඇතිවන ප්‍රමාදයන් මඟහරවාගැනීම සඳහා වාර්ෂික ස්ථාන මාරු වීම් ඉල්ලුම් කිරීමට අපේක්ෂිත නිලධාරීන් https://moe.gov.lk/ යන වෙබ් ලිපිනය ඔස්සේ මාර්ගගත ක්‍රමයෙන් සිය ස්ථාන මාරු අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

II. මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉදිරිපත් නොකරන ලද අයදුම්පත් වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු නොලැබේ. එම නිසා මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

III. මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී එක් අයදුම්පතක් සඳහා එක් විද්‍යුත් ලිපිනයක් පමණක් භාවිතා කළ යුතුය. එකම විද්‍යුත් ලිපිනයක් භාවිතා කරමින් කිහිපදෙනෙකුගේ අයදුම්පත් යොමු කිරීමේදී එම අයදුම්පත් පරිගණක ගත කිරීමේදී ගැටළු පැන නැගී ඇත.

IV. එයට අමතරව නිලධාරීන් මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කිරීමේදී සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි මුද්‍රිත පිටපත තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සමඟ ඉදිරිපත් කළ යුතුවේ.

V. ඉහත කී වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය අනුව පිහිටුවන ලද ස්ථාන මාරු කමිටු වෙත පහත සඳහන් ලියවිලි 2025 ජූලි මස 31 දිනට පෙර ලියාපදිංචි තැපැලෙන් ඉදිරිපත් කිරීමට ආයතන ප්‍රධානීන් ක්‍රියාකළ යුතුය.

(අ.) i. සියලු ම ස්ථාන මාරු අයදුම්පත් උපලේඛනගත කරන ලද වාර්ෂික ස්ථාන මාරු ආකෘති පත්‍රයෙහි මෘදු පිටපත පැතුරුම්පතක (excel sheet) ඇතුළත් කර 2025annualtransfer@gmail.com යන විද්‍යුත් ලිපිනය වෙත යොමු කිරීම අනිවාර්ය වේ. (ඇමුණුම් අංක 01) එම උපලේඛනයට අදාළ පැතුරුම්පත (excel sheet) https://moe.gov.lk/ යන වෙබ් ලිපිනය ඔස්සේ ලබා ගත හැක.

(ආ) i. 2025.12.31 දිනට එකම සේවා ස්ථානයේ වසර 05 කට වඩා සේවා කාලයක් සම්පූර්ණ වන නිලධරයන්ගේ තොරතුරු ඇතුළත් ආකෘතිය (ඇමුණුම් අංක 02) නිවැරදිව සම්පූර්ණ කර අදාළ ආයතන ප්‍රධානියා විසින් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත එවීම අනිවාර්ය වේ.

ii. එමෙන්ම, ඇමුණුම් අංක 02 දරන ආකෘතියෙහි ආයතනය තුළ රඳවා ගැනීමට අවශ්‍ය නිලධරයන් සහ වෛද්‍ය සහතික මඟින් සනාථ කර ඇති බරපතල රෝගාබාධවලින් පෙළෙන ස්ථාන මාරු නොකළයුතු නිලධරයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියා පුද්ගලිකවම සනාථ කළ යුතුය.

iii. තවද **එම ලේඛනයේ මෘදු පිටපත පැතුරුම්පතක (excel sheet) ඇතුළත් කර 2025annualtransfer@gmail.com යන විද්‍යුත් ලිපිනය වෙත යොමු කිරීම අනිවාර්ය වේ.** එම උපලේඛනයට අදාළ **පැතුරුම්පත (excel sheet)** https://moe.gov.lk/ යන වෙබ් ලිපිනය ඔස්සේ ලබා ගත හැක.

(ඈ) ඉහත සඳහන් සියලු ම ආකෘති පත් ලේකම්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල යන ලිපිනයට එවිය යුතු අතර එම අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස කෙලවරෙහි **"අනධ්‍යයන කාර්ය මණ්ඩල වාර්ෂික ස්ථාන මාරු - 2026"** ලෙස සඳහන් කර එවිය යුතුය.

**06. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව**

I. ස්ථාන මාරු කමිටු විසින් ඉදිරිපත් කරනු ලබන ස්ථාන මාරු යෝජනාවන්ට විරුද්ධව කෙරෙන අභියාචනා සලකා බැලීම සඳහා කාර්ය පටිපාටික රීතින්හි 254 (I) වගන්තිය අනුව වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පිහිටුවා ඒ අනුව අවශ්‍ය කටයුතු කරනු ලැබේ. වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා බලනු ලබන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතීන්හි 254 (III) වගන්තියට අනුකූල වේ නම් පමණි.

II. නිලධරයකුගේ ඉල්ලීමක් අනුව කරන ලද මාරුවීමක් අවලංගු කරන ලෙස හෝ කල් දමන ලෙසට පසුව අභියාචනා කිරීමට එම නිලධරයාට හෝ ඒ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට හෝ හිමිකමක් නැත.

III. ස්ථාන මාරු නියෝගයන්ට විරුද්ධව කෙරෙන අභියාචනා සලකා බැලීම සඳහා වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු විසින් පහත සඳහන් කරුණු පිළිබඳ තවදුරටත් පරීක්ෂා කර තීරණ ගනු ඇත.

(අ) මාරුවීම් ප්‍රතිපත්තියට අනුකූල නොවන පරිදි කරන ලද මාරුවීම්

(ආ) නිලධරයන්ගේ ඉල්ලීම් ඉටු නොවුනු අවස්ථා (මනාප අනුව 1, 2, 3 යන සේවා ස්ථාන ඉල්ලීම් ලෙස සලකනු ලැබේ.)

(ඇ) නිලධරයන් ගේ ඉල්ලීම් වලට පටහැනි ලෙස කරන ලද මාරුවීම්

(ඈ) ස්ථාන මාරුවීම් අයදුම් කරන ලද දිනයෙන් පසුව නිලධරයන්ට සිදුවූ හදිසි විපත්, කරදර, අසනීප වැනි සානුකම්පිත තත්වයන් පිළිබඳව පිළිගත හැකි නිර්දේශ ඉදිරිපත් කිරීම්.

III. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු තීරණ නිකුත් කල පසු ඉදිරිපත් කරනු ලබන අභියාචනා කාර්ය පටිපාටික රීතීන්හි XIX වන පරිච්ඡේදයහි 256 වගන්තිය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත

ඉදිරිපත් කළ යුතුය. සමාලෝචන කමිටුවට ඉදිරිපත් නොවූ අභියාචනා පිළිබඳ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සලකා බලනු නොලැබේ.

**07.** **ස්ථාන මාරු කාලසටහන**

| | කාර්යය | දිනය |
|---|---|---|
| 01 | වාර්ෂික ස්ථාන මාරු කමිටුව පිහිටුවීම | ජූනි මස 16 වන දිනට පෙර |
| 02 | වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය නිකුත් කිරීම | ජූනි මස 30 වන දිනට පෙර |
| 03 | සම්පූර්ණ කරන ලද වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර අදාළ බලධාරියාගේ නිර්දේශය සහිතව අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම | ජූලි මස 31 වන දිනට පෙර |
| 04 | අයදුම්පත්‍ර ස්ථාන මාරු කමිටුවට භාරදීම | අගෝස්තු මස 10 වන දිනට පෙර |
| 05 | වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා අදාළ බලධරයා වෙත ලිඛිතව භාර දීම | අගොස්තු මස 31 වන දිනට පෙර |
| 06 | වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ යෝජිත ස්ථාන මාරු අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය මඟින් ප්‍රසිද්ධ කිරීම සහ සමාලෝචන කමිටු පත්කිරීම | සැප්තැම්බර් මස 15 වන දිනට පෙර |
| 07 | ස්ථාන මාරු වීම් පිළිබඳ සමාලෝචන කමිටු නිර්දේශ ඉදිරිපත් කිරීම | ඔක්තෝම්බර් මස 15 වන දිනට පෙර |
| 08 | වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ අදාළ බලධාරියා වෙත භාරදීම | නොවැම්බර් මස 01 වන දිනට පෙර |
| 09 | අවසාන වාර්ෂික ස්ථාන මාරු වීම් නියෝග අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය මඟින් ප්‍රසිද්ධ කිරීම | නොවැම්බර් මස 15 වන දිනට පෙර |
| 10 | අවසාන වාර්ෂික ස්ථානමාරු වීම් නියෝග නිකුත් කිරීම | දෙසැම්බර් මස 01 වන දිනට පෙර |
| 11 | වාර්ෂික ස්ථාන මාරු නියෝග බලාත්මක කිරීම | 2026 ජනවාරි 01 දින සිට |

**08.** **වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ වගකීම**

I. ස්ථාන මාරුවීම් ලැබීමට ඉඩ ඇතැයි සිතෙන කිසියම් නිලධාරියෙකු සේවා අවශ්‍යතාව මත තවත් වර්ෂයක් තම ආයතනය තුල රඳවාගත යුතු යැයි ආයතන ප්‍රධානියා අදහස් කරන්නේ නම්, නිර්දේශිත අයදුම්පත්‍ර යොමු කරන අවස්ථාවේදීම ඒ පිළිබඳව පැහැදිලි කර අදාළ ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කළ යුතුය. එක් ආයතන ප්‍රධානියෙකුට සීමිත නිලධරයන් පිරිසක් සඳහා පමණක් ඉල්ලීම් කළ හැක. එක් වතාවකදී මෙම අවස්ථාව ලබාදී ඇති නිලධරයෙකු සඳහා නැවත අවස්ථාවක් ලබාදෙනු නොලැබේ.

II. සෑම නිලධරයෙකු පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතුය. සාවද්‍ය, අසම්පූර්ණ තොරතුරු සපයා ඇති බව අනාවරණය වුවහොත් ඒ පිළිබඳව අදාළ ආයතන ප්‍රධානීන් හා එම ලැයිස්තු සකස් කළ හා හරි වැරදි බලන ලද නිලධරයන් වගකීමට බැඳී සිටින අතර, සාවද්‍ය කරුණු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

III. වාර්ෂික ස්ථාන මාරු නියෝග මඟින් ආයතනයෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබා ඇති නිලධරයන් අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකිවන සේ ඔවුන් මුදාහැරීමට කටයුතු කළ යුතුය. මෙම විධිවිධාන වලට පටහැනිව කටයුතු කරන ආයතන ප්‍රධානීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීම පිණිස අදාළ බලධරයන් වෙත වාර්තා කරනු ලැබේ.

IV. ඉල්ලුම් කළ සේවා ස්ථානයක් වෙත ස්ථාන මාරු ලැබී ඇත්නම් එම ස්ථාන මාරුව නැවත සංශෝධනය කිරීමක් කරනු නොලැබේ.

V. ස්ථාන මාරු ලැබූ නිලධරයන් නියමිත දින සිට නව සේවා ස්ථානයේ රාජකාරි කටයුතු වලට වාර්තා කර තිබියදීත් ඇතැම් ආයතන ප්‍රධානීන් විසින් අදාළ නිලධරයන් මුදාහැර නොමැති අවස්ථා වාර්තා වී ඇත. එවැනි අවස්ථා උද්ගත නොවීමට ආයතන ප්‍රධානීන් වගබලාගත යුතුය.

VI. ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයෙහි 11 වගන්තියෙහි විධිවිධාන වලට ද නිලධරයන්ගේ අවධානය යොමු කළ යුතුවේ.

VII. ස්ථාන මාරු ලැබේයැයි අපේක්ෂා කරන නිලධරයන්ගේ රාජකාරී කටයුතු කල් ඇතිව වෙනත් නිලධරයෙකුට පුහුණුකර, වාර්ෂික ස්ථාන මාරුවීම් නියමිත දිනට ක්‍රියාත්මක කරවීමට ආයතන ප්‍රධානීන් විසින් කටයුතු කළ යුතුය. මෙවැනි කරුණු සම්බන්ධයෙන් පසුව කෙරෙන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

VIII. මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ඔබගේ ආයතනයේ සියලු නිලධරයන් වෙත දැනගැනීමට සැලැස්විය යුතුය.

IX. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයෙහි 257 (I),(II),(III),(IV),(V),(VI) වගන්තිවල සඳහන් විධිවිධාන බලපැවැත්වෙනු ඇත.

**09. නිලධරයන්ගේ වගකීම**

වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලැබූ සියලු ම නිලධරයන් නියමිත දිනයේ දී නව රාජකාරි ස්ථාන වෙත සේවය සඳහා වාර්තා කිරීමට බැඳී සිටිති.

**10.** මෙම චක්‍රලේඛයේ දක්වා නොමැති විධිවිධාන සම්බන්ධයෙන් අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

**11.** මෙම චක්‍රලේඛය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයෙහි XVIII පරිච්ඡේදයේ 251 වගන්තිය අනුව නිකුත් කරනු ලැබේ.

නාලක කලුවැව
ලේකම්

පිටපත් -

01. සියලු ම අතිරේක ලේකම්වරු
02. සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
03. ප්‍රධාන මූල්‍ය නිලධාරි
04. අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රමසම්පාදන)
05. අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්)
06. විද්‍යාපීඨ කොමසාරිස්
07. අධ්‍යාපන අධ්‍යක්ෂ (ගුරු අධ්‍යාපන පරිපාලන)

} කරු. අවශ්‍ය කටයුතු සඳහා

ඇමුණුම 01

එක් එක් සේවාවන් සඳහා වෙන වෙනම ආකෘති සම්පූර්ණ කිරීමට කටයුතු කරන්න

## වාර්ෂික ස්ථානමාරු අයදුම්පත් උපලේඛනය - 2026

විදුහල.∴ විද්‍යා පීඨය.∴ ගුරු විද්‍යාලය .∴ ගුරු මධ්‍යස්ථානය :-

| අනු අංකය | නිලධරයාගේ නම | ස්ථිර පත්වීම් ලිපිනයේ අංකය | ජාතික හැඳුනුම්පත් අංකය | ශ්‍රේණිය | උපන් දිනය හා 2025.12.31 දිනට වයස | විවාහක / අවිවාහක බව කලත්‍රයාගේ සේවා ස්ථානය | දරුවන් සංඛ්‍යාව සහ පාසල් යන දරුවන් සංඛ්‍යාව | කලත්‍රයා ආරක්ෂක සේවයේ ක්‍රියාන්විත රාජකාරියේ සිට ආබාධිත වූ අයෙක්ද | වර්තමාන සේවා ස්ථානයේ කාල සීමාව අවු. මාස. | මාරුවීම ඉල්ලීමට හේතු | මාරුවීමට කැමති ස්ථාන තුනක් සඳහන් කරන්න | මාරු කමිටුවේ තීරණය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | | | | | | | 1 | |
| | | | | | | | | | | | 2 | |
| | | | | | | | | | | | 3 | |
| 2 | | | | | | | | | | | 1 | |
| | | | | | | | | | | | 2 | |
| | | | | | | | | | | | 3 | |
| 3 | | | | | | | | | | | 1 | |
| | | | | | | | | | | | 2 | |
| | | | | | | | | | | | 3 | |
| 4 | | | | | | | | | | | 1 | |
| | | | | | | | | | | | 2 | |
| | | | | | | | | | | | 3 | |

සියළුම නිලධාරීන්ගේ අයදුම්පත් මෙම උප ලේඛනයට ඇතුලත් කර ඇති බව සහතික කරමි..

සකස් කලේ නම....................................... අත්සන:........................

තනතුර.........................................

පරීක්ෂා කලේ: නම...............................................

තනතුර......................................... අත්සන:............................

දිනය:............................... ...............................................................

විදුහල්පති.∴ ආයතන ප්‍රධානියාගේ අත්සන්

නිලමුද්‍රාව

ඇමුණුම02

එක් එක් සේවාවන් සඳහා වෙන වෙනම මෙම ආකෘති සම්පූර්ණ කිරීමට කටයුතු කරන්න
එක් සේවා ස්ථානයක අවුරුදු 5කට වැඩි කාලයක් සේවය කර ඇති සියලුම නිලධාරීන්ගේ විස්තර
මෙහි අනිවාර්යයෙන්ම ඇතුලත් විය යුතු බව සලකන්න(2025.12.31 දිනට)
වැඩිම සේවා කාලයක් ඇති නිලධාරීන්ගේ නම් මුලින්ම ඇතුලත් වියයුතු බව සලකන්න

පාසල/විද්‍යාපීඨය/ගුරු විද්‍යාලය/ගුරු මධ්‍යස්ථානය :- ................................................................................

තනතුර :- ...........................................................

| නිලධරයාගේ නම මයා/මිය/මෙය යන්න සඳහන් කරන්න | ස්ථිර පත්වීම් ලිපියේ අංකය | ජාතික හැඳුනුම්පත් අංකය | ශ්‍රේණිය | උපන්දිනය හා 2025.12.31 දිනට වයස හා ලිපිනය | වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය 2025.12.31දිනට | පාසල/ආයතනය තුළ සම්පූර්ණ සේවා කාලය | විවාහක/අවිවාහක බව කලත්‍රයාගේ සේවා කාලය | පාසල් යන ළමයින් පිලිබඳ විස්තර | ස්ථිර ලිපිනය | තාවකාලික ලිපිනය | දැනට පදිංචි ස්ථානයේ සිට වර්තමාන සේවා ස්ථානයට ඇති දුර | මුල් පත්වීමේ සිට සේවා ස්ථාන හා කාල සීමාවන් | වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම්කර තිබේද<br><br>සේවා ස්ථානය/සීමාව අවු. මාස. | අයදුම්කර නොමැති නම් ස්ථාන මාරුවක් ලැබුනහොත් සේවය කිරීමට කැමති ස්ථාන තුනක් නම් කරන්න |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | |

පාසල/විද්‍යාපීඨ/ගුරු විදුහල/ගුරුමධ්‍යස්ථානයහි රඳවාගැනීමට අවශ්‍ය වෛද්‍ය සහතික මගින් සනාථ කරඇති බරපතල රෝගාබාධවලින් පෙලෙන ස්ථාන මාරු පරීක්ෂා කලයුතු නිලධාරීන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියා පුද්ගලිකවම සනාථ කලයුතුය.

සකස් කළේ -: නම - .....................................

අත්සන :- ........................................